ගම්පහ ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
-------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
----------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 22 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
---------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර ගිණුම්ගත කලයුතු අවම වටිනාකමක් හා වත්කමෙ ස්වභාවය හා ආයු කාලය අනුව ස්ථාවර වත්කම් ගිණුම් ගතකර නොතිබුණි. | ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනා ගත යුතු වේ. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එය අවසන් වූ පසුව ස්ථාවර වත්කම් පිළිබඳව ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව ගිණුම් සකස් කිරීමට කටයුතු කරමි. |

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් මිලදී ගන්නා ලද රු.1,166,100 ක් වටිනා කාර්යාල උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2020 වර්ෂයේදීගිණුම්ගත කිරීමට පියවර ගනිමි. |

## 1.3.3 නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 05 ක ශේෂ එකතුව රු.390,457,697 ක් වුවද උපලේඛන අනුව ශේෂයන්ගේ එකතු වටිනාකම රු. 185,324,215 ක් වූයෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.205,137,246 ක වෙනසක් නිරීක්ෂණය විය. | ලේඛන හා උපලේඛන ශේෂයන් නිවැරදි කිරිමට කටයුතු කළයුතු වේ. | තවදුරටත් ලේඛණ පරීක්ෂා කර නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ස්ථාවර වත්කම් ගිණුම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.4,493,001 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | මෙය කම්පැක්ටරය සඳහා වූ ණය මුදලේ ශේෂයයි. |

## 1.3.4 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.340,699,313 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් ශේෂ 05 කට අදාලව විධිමත්ව නඩත්තුකළ ලේඛන ඉදිරිපත් නොකෙරුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළයුතු වේ. | වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟහිටි පෙර මුදල් ලෙස වසර ගණනාවක සිට පැවත එන රු.784,000 ක ශේෂය නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කරගැනීමට පියවර ගත යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ට පැවති රු.45,225,956 ක ණයගැති ශේෂය තුල වසර 3-5 අතර කාලයට අදාල රු.2,667,712 ක් වූ අතර රු.94,276,793 ක ණයහිමි ශේෂය තුල වසර 3-5 අතර කාලයට අදාල රු.11,113,413 ක් විය. | අයකර ගත යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම්**

--------------------

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1940 අංක 30 දරන තක්සේරු පනත | වර්ෂ 05 කට වරක් වරිපනම් තක්සේරුවක් කරගතයුතු වුවද, 2002 තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකර තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී තක්සේරු කටයුතු ආරම්භ කිරීමට නියමිතය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i)396(ඈ) | නිකුත්කර මාස 06 ඉක්මවූ රු.33,944 ක් වූ චෙක්පත් 11 කට අදාලව කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | චෙක්පත්වල වටිනාකම ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| | (ii)571 | වසර දෙක ඉක්මවූ රු.442,954 ක් වටිනා තැන්පත් සම්බන්ධව කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | තැන්පත් මුදල් ආදායමට ගැනිමට කටයුතු කරමි |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,580,454 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.83,695,147 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කලමුදල | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 16,132,100 | 20,340,931 | 19,307,359 | 37,167,279 | 18,539,500 | 18,600,577 | 17,198,554 | 36,354,071 |
| කුලී | 9,010,500 | 7,759,181 | 7,878,707 | 2,636,692 | 9,629,200 | 8,055,013 | 9,255,499 | 3,289,138 |
| බලපත්‍ර ගාස්තු | 1,401,000 | 723,676 | 724,676 | - | 1,351,000 | 770,490 | 1,267,717 | 1,000 |
| වෙනත් ආදායම් | 203,158,400 | 98,000,000 | - | 137,092,471 | 92,750,600 | - | 2,838,900 | - |
| | 229,702,000 | 126,823,788 | 27,910,742 | 176,896,442 | 122,270,300 | 27,426,079 | 30,560,670 | 39,644,209 |

### 2.2.1 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හෙනරත්ගොඩ උප කාර්යාලයේ අවුරුදු 10 ට වැඩි මිලියන 12.8 ක හා ගලහිටියාව උප කාර්යාලයේ අවුරුදු 10 ට වැඩි මිලියන 5.2ක හිඟ ශේෂ පැවතුණි. | වරිපනම් අයකිරීමේ ක්‍රියාමාර්ග වැඩිකරගැනීම කළ යුතුය. | හිඟ ශේෂයන් පැවතීමේ දුර්වලතාවය මඟ හරවා ගැනීමට අවශ්‍ය පියවර මේ වන විටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවත් දන්වා සිටිමි. |

### 2.2.2 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දුරකතන කුළුණු තක්සේරුකර වරිපනම් බදු අයකරගැනීමට පියවර ගෙන නොතිබුණි. | සභා බල ප්‍රදේශයේ සියළුම දුරකථන කුළුණු තක්සේරු කර වරිපනම් බදු අයකර ගත යුතු වේ. | හෙනරත්ගොඩ උප කාර්යාලය හැර අනෙක් කාර්යාලවල තක්සේරු කර වරිපනම් බදු අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

2.2.3 **පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2020 ජනවාරි 09 දින වන විටත් ආයතන 24 ක් පරිසර බලපත්‍ර අළුත් කරවා ගැනීමට ඉල්ලුම්පත් ඉදිරිපත්කර නොතිබුණු අතර පරිසර බලපත්‍රය ලබාදී තිබූ කර්මාන්තය පිළිබඳ පසු විපරමක් සිදුකර නොතිබුණි. තවද සභා බල ප්‍රදේශයේ පරිසර බලපත්‍ර ලබාගතයුතු ව්‍යාපාර කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතු වේ. | ඉදිරියේදී පරිසර බලපත්‍ර ලබාදීමට සුදුසු පියවර ගන්නා බවත් දන්වා සිටිමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 15 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතුය. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරගෙන යන බවත් දන්වා සිටිමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රවර්තන වර්ෂය සඳහා පිළියෙලකළ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් රු.9,380,000 ක ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලැස්මට අනුව ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කල යුතු වේ. | වැඩසටහන් ගණනාවක් ඉටුකර ගැනීමට නොහැකිවිය. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සභා බල ප්‍රදේශය තුළ දිනකට දිරන කසළ ටොන් 10 – 15 අතර හා නොදිරන කසළ ටොන් 3- 6 ත් අතර ප්‍රමාණයක් ජනනය වන අතර කසළ ඉවත්කිරීම සඳහා 2019 වර්ෂයේ රු.මිලියන 14 කට අධික වැය බරක් දරා තිබුණි. නමුත් කසළ සඳහා මිලක් ලබාගැනීමට හා විධිමත් කසළ බැහැර කිරීමේ ක්‍රමවේදයක් සැකසීමට සභාව කටයුතුකර නොතිබුණි. | විධිමත් කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගත යුතු වේ. | කසළ අංගනයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු ඉඩමක් මිල දී ගතහොත් කොම්පෝස්ට් අංගනයක් ඉදිකර දිරන කසල සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනය තුලින් මිලක් ලබාගැනීමට අවස්ථාව මෙන්ම විධිමත් ලෙස කසළ බැහැර කිරීමට හැකියාවක් පවතින බවත් දන්වා සිටිමි. |
| (ii) බල ප්‍රදේශය තුල සුපිරි වෙළඳසැල් 08 කට අධික ප්‍රමාණයකින් හා වෙනත් ආයතන වලින් දෛනිකව කසළ ලබාදෙනමුත් කසළ ගාස්තු අයකිරීමට පියවරගෙන නොතිබුණි. | කසළ බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ජනනය වන කසළ ප්‍රමාණය අනුව කසළ මත ගාස්තු අය කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |

(ඈ) **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රවර්තන වර්ෂයේ අවසානය වන විට මහජන පැමිණිලි 224 ක් ගලහිටියාව උප කාර්යාලයටද, පැමිණිලි 144 ක් හෙනරත්ගොඩ උප කාර්යාලයටද, ලැබී තිබූ අතර ඉන් පැමිණිලි 96 ක් හා පැමිණිලි 57 ක් නොවිසඳී තිබුණි. | මහජන පැමිණිලි කඩිනමින් විසඳීමට පියවර ගත යුතු වේ. | බොහෝ පැමිණිලි කැඳවූ අවස්ථාවලදී එකඟත්වයකට නොපැමිණීම හේතු කොට ගෙන මෙම තත්වය උදා වී ඇති බවත් දන්වා සිටිමි. |

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා දිගුකාලීන සැලසුම් 2019-2023 පිලියෙලකර තිබූ අතර 2019 වර්ෂයේ අදාල අරමුණු කරා යොමුවීමේ ප්‍රගතියේ ප්‍රතිශතය සියයට 50 ක් විය. | තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු ලගාකර ගැනිමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ සිට එය සාර්ථකව ඉලක්කයන් කරා ලඟාවීමට හැකියාව ඇති බව දන්වා සිටිමි. |

3.2 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රවර්තන වර්ෂය අවසානය වන විට අනුමත මුළු සේවක සංඛ්‍යාව තුල පුරප්පාඩු 07 ක් හා අතිරික්ත 02 ක් ද විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත අනුමත කර ගැනීමට කටයුතු කල යුතු වේ . | පුරප්පාඩු 07 ක් සහ අතිරික්ත 02 ක් බව පිළිගනිමි. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාන මාරුවීගිය නිලධාරීන්ගෙන් රු.600,840 ක් අයවීමට පැවති අතර මින් හිඟ ශේෂ 5 කට අදාලව රු.298,436 ක් අයවිය යුතුව පැවතුණි. | අයවිය යුතු සේවක ණය කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

3.3 **වත්කම් කළමනාකරණය**

----------------------------

3.3.1 **පවරා නොගත් වත්කම්**

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පලාත් පාලන අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද හා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් ලද වටිනාකම හඳුනා නොගත් වාහන 02 ක් ඇතුළුව රු.48,663,157 ක් වටිනා වාහන 11 ක් 2019 මැයි 18 දින වන විටත් පවරාගෙන නොතිබුණි. | අදාල වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි. |

3.3.2 **වාර්ෂික භාණ්ඩ / තොග පරීක්ෂණය**

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමීක්ෂණ මණ්ඩල වෙත ඉදිරිපත් නොකළ හෙනරත්ගොඩ මහජන පුස්තකාලයේ පොත් 602 ක් හා ගලහිටියාව මහජන පුස්තකාලයේ පොත් 187 ක් පැවතුනි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව කටයුතු කිරීමට මේ වන විට මූලික පියවර ගෙන ඇත. |

3.4 **ප්‍රසම්පාදනය**

------------

3.4.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර තිබුණු නමුත් 2019 වර්ෂයේ මිලදීගත් රු.1,968,725 ක කාර්යාල උපකරණ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | සියළු මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කළ යුතු වේ. | එය අතපසුවීමකි. |